CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ උත්සාහය වලක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද අතුරු තහනම් නියෝගය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිකුත් කල ප්‍රකාශය

***2018 නොවැම්බර් 13, කොළඹ, ශ්‍රී ලංකාව:*** පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් ජනාධිපතිවරයා විසින් 2018 නොවැම්බර් 9 වන දින සිදු කළ විශේෂ ප්‍රකාශය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙසැම්බර් 7 වැනි දා දක්වා අත්හිටුවීමට කටයුතු කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සතුටින් පිළිගනී. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්‍ෂකවරයාගේ  පෙත්සම් ඇතුළු මේ පිළිබඳව වූ මූලික අයිතිවාසිකම් පෙත්සම් ගනණාවක්ම විභාග කිරීමට අධිකරණය විසින් අනුමැතිය දී ඇත. ජනාධිපතිවරයා විසින් උත්සාහ කරන ලද මෙම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට එරෙහිව අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළ එකම සිවිල් සමාජ සංවිධානය වුයේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යි. මෙම විසුරුවා හැරීම නීති විරෝධි වන බව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන්නක් වන බව අප මුල සිටම හා පැහැදිලි ලෙසම දැරූ ස්ථාවරය යි. දෙසැම්බර් මස මුල දී යෙදී ඇති පූර්ණ අධිකරණ විභාගයේ දී මෙම තර්කය අනුව කරුණු ඉදිරිපත් කිරීමට අපි උනන්දුවෙන් බලාපොරොත්තුව සිටිමු.

අභියෝගයට ලක් ව ඇති විසුරුවා හැරීම අත්හිටුවමින් අතුරු සහනයක් ලබා දුන් අගවිනිසුරු නලින් පෙරේරා, විනිසුරු ප්‍රියන්ත ජයවර්ධන හා විනිසුරු ප්‍රසන්න ජයවර්ධන මහත්වරුන්ගෙන් සමන් විත වූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල විසින් සීඝ්‍ර ලෙස පිරිහෙමින් පැවැති තත්ත්වයක් තුල දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල නිසි ක්‍රියාදාමය නගා සිටුවීම පිණිස කටයුතු කොට ඇත. එම ක්‍රියාව ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුධය විසඳීමේ ඉඩප්‍රස්තාවන් ශක්තිමත් කරන, සතුටින් පිළිගත යුතු මැදිහත් වීමක් වන බව කිව යුතුව ඇත.  ශ්‍රී ලංකාවේ අධිකරණ ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, මූලික අයිතිවාසිකම්, නීතියේ ආධිපත්‍යය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙත වූ තම කැපවීම මෙසේ ශක්තිමත් ලෙස හඟවා සිටීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රශංසාව හිමි වෙයි.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org